# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 13,023 — 1962 අප්‍රේල් 13 වැනි සිකුරාද — 1962.4.13

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට |
|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ආදිය ... ... | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය ... | 603 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය ... | 603 |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය | 604 |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | 605 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 606 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහා බැංකුවේ දැන්වීම් ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | 610 |
| "පුරාබද්ධ ආඥාපනත" පිළිබඳ දැන්වීම් ... ... | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය

1962 අංක 143

අංකය: ඩී. 149/ආර්ර්සිපී.

### රාජකීය ලංකා ගුවන් හමුදාව—නිවැරදි කිරීමක්

**අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද ශාඛා මාරු කිරීමක්**

ඉහත සඳහන් ශීර්ෂය යටතේ, 1962 මාර්තු මස 2 වන දින අංක 12,947 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ 1962 අංක 91 දරණ නිවේදනයේ "බලපංති ප්‍රතිනන් පසියගලගේ නොයෙල් සරණපාල ප්‍රනාන්දු (01065) පී.සී." යනුවෙන් සඳහන් කර ඇති කොටස කපා හැර ඒ වෙනුවට "පියසර නිලධාරි පසියාගලගේ නොයෙල් සරණපාල ප්‍රනාන්දු (01065) පී.සී." කියා සඳහන් කළ යුතුය.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. කර්‍යු. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු
අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1962 අප්‍රේල් මස 2 වෙනි දින,
කොළඹ දීය.

4-403

## රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය

1962 අංක 144

ඒ. 49/62.

සිවිල් සේවක ඩී. ජී. දයාරත්න මහතා 1962 පෙබරවාරි මස 9 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු අතිරේක ඉඩම් කොමසාරිස් වශයෙන් වැඩ බැලීමට.

ඒ. 70/62.

සිවිල් සේවක පී. කාසිලිංගම් මහතා 1962 මාර්තු මස 7 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් වශයෙන් වැඩ බැලීමට.

ඒ. 15/62.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කොමසාරිස් එස්. සින්නම්පලම් මහතා 1961 ඔක්තෝබර් මස 23 වැනි දින සිට එම දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් ලෙස වැඩ බැලීමටත්, 1961 දෙසැම්බර් මස 16 වැනි දින සිට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් ලෙසත්.

ඒ. 102/61.

1959 ජනවාරි මස 22 වැනි දින සිට (463 උපග්‍රන්ථයේ) ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනතේ 3 (1) වැනි ඡේදය යටතේ ජී. සුගතපාල මහතා නිරවුල් කිරීමේ සහකාර නිලධාරි වශයෙන්.


**සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.**

**ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).**

**ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායකමුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායකමුදල් භාරගනු නොලැබේ.**

මේ සම්බන්ධව "පී. සුගතපාල" මහතා යනුවෙන් යොදා 1962 මාර්තු මස 30 වැනි දින ගැසට් පත්‍රයේ 508 වැනි පිටුවේ පළකරන ලද ගැසට් නිවේදනය මෙයින් අවලංගු කරනු ලැබේ.

සී. ජ. වල්පිට,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 අප්‍රේල් මස 9 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම්
ගොඩනැගිල්ලේ, රාජ්‍ය සේවා කොමිෂන්
සභා කායසීලයේ දීය.
තැ. පෙ. 500.

4-437

## අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය

**1962 අංක 145**

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත්කිරීම් කර ඇත්තේ ය:—

අංකය : ජේඒ. 2/48.

ඒ. ඊ. ආර්. කොරෙයා මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 මාර්තු 27 වැනි දින සිට, මාතර දිස්ත්‍රික් උසාවියේ අංක එල්/1069, එල්/426, එල්/758, පී/1383, පී/1266, පී/1011, 22180, එම්/1010, 19678, එල්/489, එම්/1579, පී/1837 සහ 20670 දරණ නඩුවල තීන්දු දීමට, මාතර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඒ. 1148.

ඕ. එල්. ද ක්‍රෙට්සර් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 අප්‍රේල් 2 වැනි දින සිට, කොළඹ දිස්ත්‍රික් උසාවියේ අංක 4821/ඕ, සහ 9395/පී දරණ නඩුවල තීන්දු දීමට හා 1962 අප්‍රේල් 3 වැනි දින සිට, කොළඹ දිස්ත්‍රික් උසාවියේ අංක 8465/පී දරණ නඩුව අවසාන වන තුරු ඇසීමට හා තීන්දුව දීමට හා 1962 අප්‍රේල් 12 වැනි දින සිට, කොළඹ දිස්ත්‍රික් උසාවියේ අංක 8762/පී දරණ නඩුව අවසාන වන තුරු ඇසීමට හා තීන්දුව දීමට, කොළඹ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඒ. 2/48.

ඒ. ඕ. ජේ. ගුණවර්ධන මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 අප්‍රේල් 7 වැනි දින සිට, අවිස්සාවේල්ලේ දිස්ත්‍රික් උසාවියේ අංක 8267, 8697, 9138, 6812, 7937, 8397 සහ 8903 දරණ නඩු අවසාන වන තුරු ඇසීමට හා තීන්දු දීමට, අවිස්සාවේල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑස්සී/පීපී. 3/62.

වී. එස්. ගුණවර්ධන මහතා නැති අතර, එල්. සමරතුංග මහතා 1962 අප්‍රේල් 2 වැනි දින සිට 31 වැනි දින දක්වා, බලපිටියේ දිස්ත්‍රික් නඩුකාර ධුරයේ වැඩ බැලීමට, හා බලපිටියේ අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයේ හා අතිරේක මහෙස්ත්‍රාත් ධුරයේ වැඩ බැලීමට හා එල්. සමරතුංග මහතා 1962 ජූනි 1 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, බලපිටියේ දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා බලපිටියේ අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑස්සී/පීපී. 3/62.

එස්. අමරසිංහ මහතා 1962 අප්‍රේල් 2 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, කොළඹ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, හා කොළඹ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑම්. 2/56 (iii).

සී. එස්. නෙත්සිංහ මහතා 1962 මාර්තු 8 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, හලාවත, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හලාවත අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, පුත්තලමේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා පුත්තලමේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑස්සී/පීපී. 3/62.

ජේ. ජේ. එෆ්. ඒ. ඩයස් මහතා 1962 අප්‍රේල් 2 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, ලංකා අධිකරණ සේවයේ නිලධාරියකු වශයෙන් වැඩ බැලීමට හා අතිරික්ත නිලධාරියකු වශයෙන් හා 1962 අප්‍රේල් 2 වැනි දින සිට (කුලියාපිටියේ පලාත් ආණ්ඩු සභාව පිහිටි සීමාව තුළ) කනදුල්ලේ පිහිටි උසාවියේ, කුරුණෑගල අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා (කුලියාපිටියේ පලාත් ආණ්ඩු සභාව පිහිටි සීමාව තුළ) කනදුල්ලේ පිහිටි උසාවියේ කුරුණෑගල අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 1සී/53.

එම්. එම්. අබ්දුල් කාදර් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. සී. කනගසිංහම් මහතා 1962 අප්‍රේල් 3 වැනි දින, ත්‍රිකුණාමලයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, ත්‍රිකුණාමලයේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, අනුරාධපුර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා අනුරාධපුර අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඒ. 25/46 (2 වැනි කොටස).

සී. සී. සෝමසේගරම් මහතා 1962 මාර්තු 27 වැනි දින සිට, යාපනේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 22799 දරණ නඩුවේ තීන්දුව දීමට, යාපනේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඒ. 3/48.

පී. ජී. ද සිල්වා මහතා 1962 අප්‍රේල් 23 වැනි දින සිට අවිස්සාවේල්ලේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 49422 දරණ නඩුව අවසාන වන තුරු ඇසීමට හා තීන්දුව දීමට, අවිස්සාවේල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට, හා අවිස්සාවේල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 34ඒ/48.

එස්. එස්. කුලතිලක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, පී. ආසීර්වාදම් මහතා 1962 මාර්තු 29 වැනි දින, රත්නපුරේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා රත්නපුරේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 54ඒ/58.

එල්. සමරතුංග මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එල්. එස්. වී. පෙරේරා මහතා 1962 මාර්තු 30 වැනි දින, බදුල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා බදුල්ල-හල්දුම්මුල්ල අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඒ. 19/48.

ඒ. එම්. එම්. තහීර් මහතා 1962 මාර්තු 28 වැනි දින සිට, ගාල්ලේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 21080 සහ 20900 දරණ නඩුවල තීන්දු දීමට, ගාල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා ගාල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 7ඒ/51.

ඒ. ඔ. එස්. දිසානායක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. ජේ. බී. ධර්මකීර්ති මහතා 1962 මාර්තු 31 වැනි දින සිට 1962 අප්‍රේල් 2 වැනි දින දක්වා, මාතලේ පිහිටි උසාවියේ ක්‍රියා කරන පිණිස, මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා මාතලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 68සී/61.

සී. වී. උදලාගම මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එච්. ඒ. ජයවික්‍රම මහතා 1962 අප්‍රේල් 9 වැනි දින සිට 15 වැනි දින දක්වා, අනුරාධපුර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, අනුරාධපුර අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, මන්නාරමේ හා වවුනියාවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, වවුනියාවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට, ත්‍රිකුණාමලයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා ත්‍රිකුණාමලයේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 51ඒ/54.

ටී. ජේ. රාජරත්නම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. එච්. උදලාගම මහතා 1962 අප්‍රේල් 3 වැනි දින සිට 7 වැනි දින දක්වා, කෑගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා කෑගල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 16ඒ/59.

ඩී. ඊ. ධර්මසේකර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. එල්. ද සිල්වා මහතා 1962 අප්‍රේල් 5 වැනි හා 9 වැනි දිනයන්හි, බලපිටියේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා බලපිටියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 49ඒ/53.

එම්. පී. සී. රත්නම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එෆ්. ඩබ්ලිව්. ගුණරත්න මහතා 1962 මාර්තු 31 වැනි දින සිට 1962 අප්‍රේල් 1 වැනි දින දක්වා, මීගමුවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, මීගමුවේ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, හා මීගමුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්.52ඒ/60.

බී. එස්. සී. රත්වත්තේ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ඒ. එම්. එම්. තාහිර් මහතා 1962 අප්‍රේල් 19 වැනි දින, ගාල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, ගාල්ලේ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට හා ගාල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 65බී/61.

ජේ. සේනාතිරාජා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එන්. කුමාරසාමි මහතා 1962 අප්‍රේල් 19 වැනි දින, මහනුවර අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, මහනුවර අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, දුම්බර අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 68බී/50.

වී. එම්. කුමාරසාමි මහතා නැවත වැඩ භාරගන්නා තුරු හෝ නැවත නියමයක් කරන තුරු, එස්. සී. කතිර්වේලු මහතා 1962 අප්‍රේල් 9 වැනි දින සිට, යාපනේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, යාපනේ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, කයිට්ස් අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා යාපනේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 6සී/52.

වී. එම්. කුමාරසාමි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, වී. කනගසබේ මහතා 1962 අප්‍රේල් 9 වැනි හා 10 වැනි දිනයන්හි, පේදුරුතුඩුවේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා පේදුරුතුඩුවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 6සී/52 (ඒ).

වී. එම්. කුමාරසාමි මහතා නැවත වැඩ බාරගන්නා තුරු හෝ නැවත නියමයක් කරන තුරු, කේ. රත්නසිංහම් මහතා 1962 අප්‍රේල් 11 වැනි දින සිට, පේදුරුතුඩුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා පේදුරුතුඩුවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : පීඑල්/එස්. 6/48.

වී. සෝමසුන්දරම් මහතා නැති අතර, පී. වී. සේනාතිරාජා මහතා 1962 අප්‍රේල් 9 වැනි දින, වවුනියාවේ හා යාපන දිස්ත්‍රික්කවල, උතුරු වවුනියාවේ හා මුහුදුබඩ පත්තු ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට හා පූනකාරි-තුන්නුකායි ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/වයි. 1/48.

එස්. ඒ. යටවර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු,' කේ. බී. එම්. සී. බණ්ඩාර මහතා 1962 අප්‍රේල් 10 වැනි හා 12 වැනි දිනයන් හි අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නැගෙනහිර නුවරගම් පළාතේ සහ බටහිර නුවරගම පළාතේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/කේ. 4/48.

කේ. අයි. කරුණාරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. එෆ්. එච්. ද අල්විස් මහතා 1962 අප්‍රේල් 16 වැනි දින සිට 19 වැනි දින දක්වා සහ 21 වැනි දින හා 23 වැනි දින සිට 25 වැනි දින දක්වා, ගාලු දිස්ත්‍රික්කයේ, කඩවත් සතරේ සහ තල්පේ පත්තුවේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/එච්. 2/48.

ඒ. එස්. හේරත් ගුණරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. එච්. අබ්දුල් කාදර් මහතා 1962 අප්‍රේල් 6 වැනි හා 7 වැනි දිනයන්හි, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙනි හත්පත්තුවේ සහ කටුගම්පොල හත්පත්තුවේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/එච්. 2/48.

ඒ. එස්. හේරත් ගුණරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. ඩබ්ලිව්. ඒ. ඉමැනුවෙල් මහතා 1962 අප්‍රේල් 2 වැනි දින සිට 5 වැනි දින දක්වා, කුරුණෑගල දිස්ත්‍රික්කයේ දඹදෙනි හත්පත්තුවේ සහ කටුගම්පොල හත්පත්තුවේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඒ. මිශ්‍ර/57.

එම්. එම්. පෙරේරා මහතා වෙනත් රාජකාරිවල යෙදී සිටින අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. ඩබ්ලිව්. ඒ. ඉමැනුවෙල් මහතා 1962 අප්‍රේල් 6 වැනි හා 7 වැනි දිනයන් හි, හා 11 වැනි, 12 වැනි හා 25 වැනි දිනද, කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේවමැදි හත්පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයට හා වන්නි හත්පත්තුවේ, කටුගම්පොල හත්පත්තුවේ සහ හිරියාල හත්පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයට.

අංකය : පීඒ. 55/57.

බී. සී. විජේසිංහ මහතා 1962 අප්‍රේල් 6 වැනි දින, දෙහිඕවිට ගම්බද උසාවියේ අංක 4842 දරණ අපරාධ නඩුව ඇසීමට, අවිස්සාවේල්ල දිස්ත්‍රික්කයේ දෙහිගම්පල් කෝරලේ සහ පාත බුලත්ගම සහ අතුලුගම් සහ පනාවල් කෝරලයන්හි ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයට හා බෙලිගල් සහ කුරුවිටි කෝරලයන්හි ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයට.

අංකය : පීඑල්/ඩබ්ලිව්. 10/53.

ටී. බී. වැත්තෑව මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, බී. එෆ්. විජේසිංහ මහතා 1962 මාර්තු 29 වැනි හා 30 වැනි දිනයන් හි, කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේවමැදි හත්පත්තුවේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට හා වන්නි හත්පත්තුවේ, කටුගම්පොල හත්පත්තුවේ සහ හිරියාල හත්පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/එම්. 5/54.

ඊ. එම්. මතියපරනාම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, පී. වී. සේනාතිරාජා මහතා 1962 අප්‍රේල් 17 වැනි, 18 වැනි හා 21 වැනි දිනද, වවුනියාවේ හා මන්නාරම් දිස්ත්‍රික්කවල, දකුණු වවුනියාවේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට හා මාන්තෙයි ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

ඇන්. ඒ. ද ඇස්. විජේසේකර,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 අප්‍රේල් 5 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. අංකය-573,
කොළඹ-12.

4-381

---

# වෙනත් පත්කිරීම් ආදිය

**1962 අංක 146**

## ගැසට් නිවේදනයයි

(20 වෙනි පරිච්ඡේදය වන) ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ 120 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ අමාත්‍යවරයා විසින් :—

අංක : ඒඅයි. 2/1/62.

1962 මාර්තු මස 14 වෙනි දින සිට, ස්ථිර පත්වීමක් කරන තුරු, කොළඹ දිස්ත්‍රික්කයේ, මත්තේගොඩ, කහතුඩුව පේරුවේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට වී. ටී. සී. රත්නායක මහතා ද,

අංක : ඒඅයි. 4/5.

1962 මාර්තු මස 26 වෙනි දින සිට, ස්ථිර පත්වීමක් කරන තුරු, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, යටිපළාත කෝරළයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට බී. එම්. කරුණාරත්න මහතා ද,

අංක : ඒඅයි. 19/1/54.

1962 පෙබරවාරි මස 20 වෙනි දින සිට බී. ඇන්. පී. ජයවර්ධන මහතා නැවත වැඩ භාරගන්නා තුරු කෑගලු දිස්ත්‍රික්කයේ, කිණිගොඩ කෝරලේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට පී. කේ. ඩිංගිරි බණ්ඩා මහතා ද,

අංක : ඒඅයි. 22/1/62.

1962 මාර්තු මස 22 වෙනි දින සිට ස්ථිර පත්වීමක් කරනතුරු, අම්පාර දිස්ත්‍රික්කයේ, අක්කරෙයි පත්තු කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට ජේ. ටී. ඒබ්‍රහම් මහතා ද,

අංක : අයිඑන්කුා./එල්. 4/1/62.

1962 මාර්තු මස 20 වෙනි දින සිට කේ. ඇම්. ජේ. උක්කු බණ්ඩා මහතා නැවත වැඩ භාරගන්නාතුරු, මාතලේ දිස්ත්‍රික්කයේ ලග්ගල උඩසිය පත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට බී. ෂහුල් හමීඩ් මහතා ද,

අංක : අයිඑන්කුා/එල්. 11/1/57.

1962 මාර්තු මස 21 වෙනි දින සිට ජේ. වී. පෙල්ඩානෝ මහතා නැවත වැඩ භාරගන්නාතුරු, මන්නාරම් දිස්ත්‍රික්කයේ, තලෙයිමන්නාරම්-පේසාලෙයි කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට එම්. ආර්. ලැම්බර්ට් මහතා ද.

අංක : අයිඑන්කපු/එල්. 21/2/62.

1962 මාර්තු මස 22 වෙනි දින සිට, කේ. නල්ලෙයිනාතන් මහතා නැවත වැඩ භාරගන්නාතුරු අම්පාරේ දිස්ත්‍රික්කයේ, සමන්තුරෙයි කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට කේ. සෝමසුන්දරම් මහතා ද,

පත් කර ඇත්තේ ය.

ජී. පී. ඒ. සිල්වා,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩ බලන ස්ථිර ලේකම්.

1962 අප්‍රේල් මස 4 වෙනි දින,
කොළඹ අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

4-270

---

1962 අංක 147

## ගැසට් නිවේදනයයි

මගේ අංකය: ඒජේ. 18/2/56.

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ ගරු අධිකරණ අමාත්‍යවරයා කෙරෙහි පවරා ඇති බලතල අනුව එතුමා විසින්—

1. ආර්. බී. ඩයිනීසියස් මහතා තංගල්ලේ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද
2. එම්. බී. කුරේරා මහතා මීගමුව අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද

පත් කර ඇත්තේ ය.

ජී. පී. ඒ. සිල්වා,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන ස්ථිර ලේකම්.

1962 අප්‍රේල් මස 9 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

4-448

---

1962 අංක 148

## දැන්වීමයි

### කාර්මික නිෂ්පාදන ද්‍රව්‍ය ආඥා පනත

ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 166 වැනි පරිච්ඡේදය

ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 166 වැනි පරිච්ඡේදය වන කාර්මික නිෂ්පාදන ද්‍රව්‍ය ආඥා පනතේ දෙවැනි වගන්තිය හා අර්ථ නිරූපන ආඥා පනතේ දෙවැනි ඡේදය යටතේ කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා වෙත පැවැරී ඇති බලතල අනුව, එතුමා විසින්, කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ සංවර්ධන අධ්‍යක්ෂ තැන්පත් බී. සී. එල්. අමරසිංහ මහතා 1962 අප්‍රේල් මස 1 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, කාර්මික නිෂ්පාදන භාණ්ඩ පාලක ධුරයට පත් කොට ඇති බව මෙයින් නිවේදනය කරමි.

වී. එල්. වීරසිංහ,
කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ වැඩ බලන ස්ථාවර ලේකම්.

1962 මාර්තු මස 30 වැනි දින,
කොළඹ දී ය.

4-249

---

1962 අංක 149

## රජයේ නිවේදනය

1962 අප්‍රේල් මස 2 වෙනි දින සිට, නැවත දැන්වීමක් කරන තුරු, විධායක ලිපිකාර 1 වෙනි ශ්‍රේණියේ නිලධාරී තැන්පත් සිරිල් නැපෝලියන් මෙල්ඩර් මහතා රජයේ ලේඛන භාරකරු වශයෙන් පත් කර ඇති බැව් මහජනයාගේ දැනගැනීම පිණිස මෙයින් නිවේදනය කරමි.

අ. දේවරාජ,
වැඩ බලන රාජ්‍ය ලේඛනාරක්ෂක.

1962 අප්‍රේල් මස 3 වෙනි දින,
නුවරඑළියේ රාජ්‍ය ලේඛනාගාරයේ දීය.

4-388

---

# ආණ්ඩුවේ නිවේදන

අංකය: 6/8/21 (ඒසී).

### ලංකා රජයේ උකස් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය

ගරු මුදල් ඇමතිතුමා විසින් ලංකා රජයේ උකස් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ පුරප්පාඩුවක් පිරවීම සඳහා ජී. ඩබ්ලිව්. එදිරිවීර මහතා 1962 අප්‍රේල් මස 2 වැනි දින සිට 1962 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා, එකී ලංකා රජයේ උකස් බැංකුවේ අධ්‍යක්ෂවරයකු හැටියට පත් කරන්ට යෙදී ඇත.

හ. පණ්ඩිත ගුණවර්ධන,
මුදල් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙනුවට.

1962 අප්‍රේල් මස 6 වැනි දින,
කොළඹ, මුදල් අමාත්‍යාංශයේ දී ය.

4-394

---

### කෘෂිකාර්මික හා කර්මාන්ත ණය දෙන සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය

අංකය: 48/4 (ඒසී).

ගරු මුදල් ඇමතිතුමා විසින් ලංකාවේ කෘෂිකාර්මික හා කර්මාන්ත ණය දෙන සංස්ථාවේ 7 වැනි අධ්‍යක්ෂ මණ්ඩලයට 1962 අප්‍රේල් මස 2 වැනි දින සිට තුන් වසක කාලයක් සඳහා පහත සඳහන් අය පත් කරන්නට යෙදී ඇත.

ඒ. ජී. ප්‍රනාන්දු මහතා.

හ. පණ්ඩිත ගුණවර්ධන,
මුදල් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙනුවට.

මුදල් අමාත්‍යාංශය,
1962 අප්‍රේල් මස 6 වැනි දින,
කොළඹ දී ය.

4-453

---

ඇල්. ඩී.—බී. 138/47

අංකය : 81/25/3 (එස්බී/ටීපී)
පී. සී. සී. අංකය : ඒ/744/13

## රේගු නිවේදනය (ගාස්තු චක්‍රය) අංකය : 62/1

### රේගු ආඥපනත

රේගු ආඥපනතේ (235 වැනි අධිකාරය) 10 වැනි වගන්තිය යටතේ පහත සඳහන් යෝජනාව නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් 1962 මාර්තු මස 29 වැනි දින පවත්වන ලද එහි ප්‍රසිද්ධ සභා වාරයේදී සම්මත කරනු ලැබූ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

1962 අප්‍රෙල් 3 වැනි දින,
කොළඹදී ය.

හෙ. ජිනදස,
මුදල් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

### යෝජනාව

මේ යෝජනාව ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි නිවේදනය කරනු ලැබූ දිනයෙහි සිට, මෙහි දක්වා ඇති උප ලේඛනයේ I වැනි තීරයෙහි සඳහන් කර තිබෙන භාණ්ඩ වෙනුවෙන් (දැනට පවත්නා නීතිය අනුව ඒ සම්බන්ධයෙන් ගෙවිය යුතු ආනයන තීරු බදුවලට තිලව් වශයෙන්) එකී උප ලේඛනයේ III වැනි තීරයෙහි පෙන්වා තිබෙන සාමාන්‍ය ප්‍රමාණයට අනුව හෝ රේගු ආඥපනතේ (235 වැනි අධිකාරය) " ඒ " උප ලේඛනයේ විධිවිධාන යටතේ වරණීය ප්‍රමාණයන් අය කළ යුතු සහ ගෙවිය යුතු අවස්ථාවලදී මෙහි දක්වා ඇති උප ලේඛනයේ 2 වැනි තීරයෙහි පෙන්වා තිබෙන වරණීය ප්‍රමාණයට අනුව හෝ, රේගු ආඥපනත යටතේ ආනයන තීරු බදු අය කළ යුතු බවටද, ගෙවිය යුතු බවට ද, රේගු ආඥපනතේ (235 වැනි අධිකාරය) 10 වැනි වගන්තිය යටතේ මේ සභාව තීරණය කරයි.

## උපලේඛනය

| I වැනි තීරය භාණ්ඩ | II වැනි තීරය වරණීය ප්‍රමාණය වටිනාකම අනුව රු. ශ. | III වැනි තීරය සාමාන්‍ය ප්‍රමාණය වටිනාකම අනුව රු. ශ. |
|---|---|---|
| සංවර්ධන අධ්‍යක්ෂ විසින් තම මතය අනුව දේශීය කර්මාන්ත සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය යයි සහතික කළහැකි (දැනට පවත්නා නීති යටතේ වරණීය වශයෙන් 7 ½% ට ද සාමාන්‍ය වශයෙන් 17½% වද, වඩා අඩු ප්‍රමාණයකට තීරුව අය කරනු ලබන යම් භාණ්ඩයක් හැර) අමු ද්‍රව්‍ය, කාර්මික යන්ත්‍ර හා උපකරණ, අඩංගු කොටස්, පරිපූර්ණ කොටස් හා ඒවායේ කොටස් ... ... ... ... ... | 7 ½% ... | 17 ½% |

4–451

---

### බන්ධනාගාර ආඥාපණත

වර්ෂ 1939 අංක 53 දරණ ආඥා පණතින් සංශෝධනය කොට වර්ෂ 1947 සැප්තැම්බර් 24 වැනි දින අංක 9773 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ප්‍රකාශයෙන් වෙනස් කර ඇති (44 වැනි පරිච්ඡේදය වන) බන්ධනාගාර ආඥා පණතේ 32 (1) (ආ) දරණ වගන්තියේ ප්‍රකාර, මෙහි උප ලේඛනයේ II වැනි තීරයේ සඳහන් තැනැත්තන්, මෙම දැන්වීමේ සඳහන් දින සිට එක් අවුරුදු කාලයකට, උපලේඛනයේ I වැනි තීරයේ සඳහන් ආයතනයේ ප්‍රාදේශීය සෝදිසි කොමිටියේ සාමාජිකයන් වශයෙන්, කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු භාර ගරු ඇමතිවරයා විසින් පත් කොට තිබේ.

ඇම්. ජේ. පෙරේරා,
කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු
භාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්
වෙනුවට ය.

1962 අප්‍රියෙල් මස 2 වැනි දින,
කොළඹ 7,
කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු
භාර අමාත්‍යාංශය.

#### උපලේඛනය

| I | II |
|---|---|
| මහර බන්ධනාගාරය. | ආර්. ඒ. ඇස්. ගුණවර්ධන මහතා. |
| | ඩබ්ලිව්. ඒ. අමරසේන මහතා. |

4-234

---

### 1954 වෙළඳශාලා හා කාර්යාල සේවක (සේවය හා වේතන විධිමත් කිරීමේ) රෙගුලාසි

වේතන විනිශ්චය මණ්ඩලවලට පත්කෙරෙන සභික නාම ලේඛනයේ සේව්‍ය නියෝජිත සාමාජිකයෙකුව සිට ඉල්ලා අස්වූ ඇෆ්. හාපර් මහතා වෙනුවට වෙළඳශාලා හා කාර්යාල සේවක (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනතේ (129 වෙනි අධිකාරය) 25 (1) වගන්තිය යටතේ කම්කරු හා ජනසතුසේවා ගරු ඇමති තුමන් විසින් ආර්. ඩබ්ලිව්. පී. කෝඩි මහතා පත්කරන ලද බව, 1954 ඔක්තෝබර් මස 15 වෙනි දින අංක 10,724 දරණ ගැසට් පත්‍රයෙහි පළකරන ලද වෙළඳශාලා හා කාර්යාල සේවක (සේවය හා වේතන විධිමත් කිරීමේ) රෙගුලාසිවල 31 වෙනි රෙගුලාසිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

සී. බී. කුමාරසිංහ,
කම්කරු හා ජනසතු සේවා අමාත්‍යාංශයේ
වැඩබලන ස්ථිර ලේකම්වරයා.

1962 අප්‍රේල් 4 වෙනි දින,
කොළඹ දීය.

4-306

---

### 1947 අංක 30 දරණ ආහාර සැපයීමේ ආඥාපනත යටතේ විනිශ්චය සභාවක් පත් කිරීම

1947 අංක 30 දරණ ආහාර සැපයීමේ ආඥා පනතේ (1948 පෙබරවාරි මස 5 වෙනි දින අංක 9,828 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ප්‍රකාශනයෙන් සංශෝධිත) 6 (1) දරණ වගන්තිය යටතේ ගරු වාණිජ, වෙළඳ, ආහාර හා නැව් ඇමතිතුමා වෙත පැවරී ඇති බලතල අනුව ඉහත සඳහන් ආඥාපනතේ අදහස් කර ඇති කරුණු උදෙසා පහත නම් සඳහන් අයගෙන් යුත් විනිශ්චය මණ්ඩලයක් ඔහු විසින් පත්කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ:—

වී. මානික්කවාසගර් මහතා (සභාපති)
ආර්. ඩී. සේනානායක මහතා
බී. මහාදේව මහතා

1961 මැයි මස 26 වන දින අංක 12,443 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය අභිභවා මේ නිවේදනය වලංගු වේ.

කේ. අල්වාපිල්ලයි,
නිත්‍ය ලේකම්,
වාණිජ, වෙළඳ, ආහාර හා නැව් අමාත්‍යාංශය.

1962.4.4 දින,
කොළඹ,
යුනියන් පෙදෙස, 330.

4-341

---

### 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

#### 49 ඡේදය යටතේ සහතිකය

පළාත් පාලන හා නිවාස පිළිබඳ ඇමතිවර, මහානාම සමරවීර වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උප ලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

මහානාම සමරවීර,
පළාත් පාලන හා නිවාස ඇමති තුමා.

1962 මාර්තු 27 වැනි දින දීය.
කොළඹ 2.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හුගේගොඩ ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ ගොතටුව අංක 513 දරණ ගම්මුලාදැනි වසමේ පිහිටි ඉඹුල් ගහඹිට නැමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති අක්කර 2 1/2 ක පමණ ප්‍රමාණයක ඉඩම් කොටසක්.

උතුරට: එච්. ඩී. ආර්. ගුණසේකරට අයිති ඉඩම; නැගෙනහිරට: කේ. ඒ. ඩී. හෙන්දිරික් සිංඤෝට අයිති ඉඩම; දකුණට: එම ඉඩමේ කොටසක් සහ ගම්සභා පාර; බස්නාහිරට: ගොතටුව ගම්සභා පාර.

4-237

---

### 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

#### 49 ඡේදය යටතේ සහතිකය

පළාත් පාලන හා නිවාස පිළිබඳ ඇමතිවර, මහානාම සමරවීර වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උප ලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

මහානාම සමරවීර,
පළාත් පාලන හා නිවාස ඇමති තුමා.

1962 මාර්තු 28 වැනි දින දීය.
කොළඹ 2,

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ, කොළඹ නගර සහා සීමාව තුළ, දෙමටගොඩ, සිරි සද්ධම්ම මාවතේ වරිපනම් අංක 119 දරණ ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති පර්චස් 73 ක පමණ ඉඩම් ප්‍රමාණයක් :

උතුරට : පුද්ගලික ඉඩම් ; නැගෙනහිරට : සිරිධම්ම මාවත ;
දකුණට : පුද්ගලික ඉඩම් ; බස්නාහිරට : කානුව.

4-236

---

## 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව

### 1961 ඡන්දදායක නාමලේඛන සංශෝධනය කිරීම

මැතිවරණ කොට්ඨාශ අංක 47 වලපනේ
මැතිවරණ කොට්ඨාශ අංක 48 හඟුරන්කෙත
මැතිවරණ කොට්ඨාශ අංක 52 කොත්මලේ
මැතිවරණ කොට්ඨාශ අංක 53 නුවරඑළිය.

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාශවල නාම ලේඛන සහතික කරන ලද බවත්, එකී නාම ලේඛන කාර්යාල වේලාවන්හිදී පරීක්ෂා කර බලාගැනීම පිණිස නුවරඑළියේ මැතිවරණ නිලධාරි තැනගේ කාර්යාලයේ තබා ඇති බවත්, 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවේ 22 (1) වැනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙනු ලැබේ.

සී. විස්වාසම්,
මැතිවරණ කොට්ඨාශ අංක 47 වලපනේ, මැතිවරණ කොට්ඨාශ අංක 48 හඟුරන්කෙත, මැතිවරණ කොට්ඨාශ අංක 52 කොත්මලේ, මැතිවරණ කොට්ඨාශ අංක 53 නුවරඑළිය,
ලියා පදිංචි කිරීමේ නිලධාරි තැන.

1962 මාර්තු මස 31 වෙනි දින.
මැතිවරණ කාර්යාලය,
නුවරඑළිය.

4-450

---

## 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව

### 1961 ඡන්දදායක නාමලේඛන සංශොධනය කිරීම

මැතිවරණ කොට්ඨාශය අංක 1—උතුරු කොළඹ
මැතිවරණ කොට්ඨාශය අංක 2—මැද කොළඹ
මැතිවරණ කොට්ඨාශය අංක 3—බොරැල්ල
මැතිවරණ කොට්ඨාශය අංක 4—දකුණු කොළඹ
මැතිව්රණ කොට්ඨාශය අංක 19—දෙහිවල-ගල්කිස්ස

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාශවල ඡන්දදායකයන්ගේ නාම ලේඛන සහතිකකොට තිබෙන බවත් ඒ නාමලේඛන කොළඹ රෙජිස්ට්‍රාර් ජනරාල් තැනගේ කන්තෝරුවේදී එහි වැඩ කරන කාලය තුළ පරීක්ෂාකර බැලිය හැකි බවත් 1946යේ ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවේ 22 (1) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඒ. ඇම්. ඇස්. පෙරේරා,
ලියාපදිංචි කිරීමේ නිලධාරි.
මැතිවරණ කොට්ඨාශය අංක 1—උතුරු කොළඹ,
මැතිවරණ කොට්ඨාශය අංක 2—මැද කොළඹ,
මැතිවරණ කොට්ඨාශය අංක 3—බොරැල්ල,
මැතිවරණ කොට්ඨාශය අංක 4—දකුණු කොළඹ,
මැතිවරණ කොට්ඨාශය අංක 19—දෙහිවල-ගල්කිස්ස.

වර්ෂ 1962ක්වූ අප්‍රේල් මස 2 වැනි දින,
කොළඹ, රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයයේදීය.

4-426/1

---

## 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව

### ඡන්දදායක නාමලේඛන සංශෝධනය—1961

අංක 37 දරණ වත්තේගම මැතිවරණ දිස්ත්‍රික්කය
අංක 38 දරණ අකුරණ මැතිවරණ දිස්ත්‍රික්කය
අංක 39 දරණ ගලගෙදර මැතිවරණ දිස්ත්‍රික්කය
අංක 41 දරණ උඩුනුවර මැතිවරණ දිස්ත්‍රික්කය
අංක 42 දරණ මහනුවර මැතිවරණ දිස්ත්‍රික්කය
අංක 43 දරණ සෙංකඩගල මැතිවරණ දිස්ත්‍රික්කය
අංක 44 දරණ කුණ්ඩසාලේ මැතිවරණ දිස්ත්‍රික්කය
අංක 45 දරණ තෙල්දෙනිය මැතිවරණ දිස්ත්‍රික්කය
අංක 46 දරණ මිනිපේ මැතිවරණ දිස්ත්‍රික්කය
අංක 49 දරණ හේවාහැට මැතිවරණ දිස්ත්‍රික්කය
අංක 50 දරණ ගම්පොල මැතිවරණ දිස්ත්‍රික්කය
අංක 51 දරණ නාවලපිටිය මැතිවරණ දිස්ත්‍රික්කය
අංක 54 දරණ මස්කෙළිය මැතිවරණ දිස්ත්‍රික්කය

ඉහත සඳහන් මැතිවරණ දිස්ත්‍රික්කවල ඡන්දදායක නාමලේඛන සහතිකකොට තිබෙන බවත්, එකී ඡන්ද නාමලේඛන මහනුවර කච්චේරියේ පිහිටි මැතිවරණ කාර්යාලයේදී, කාර්යාල වේලාවන්හිදී පරීක්ෂාකර බැලීමට හැකි බවත් වර්ෂ 1946යේ ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවේ 22 (1) වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

බී. ආර්. ඕ. පෙරේරා,
සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරි තැන,
අංක 37 දරණ වත්තේගම මැතිවරණ දිස්ත්‍රික්කය, අංක 38 දරණ අකුරණ මැතිවරණ දිස්ත්‍රික්කය, අංක 39 දරණ ගල ගෙදර මැතිවරණ දිස්ත්‍රික්කය, අංක 41 දරණ උඩුනුවර මැතිවරණ දිස්ත්‍රික්කය, අංක 42 දරණ මහනුවර මැතිවරණ දිස්ත්‍රික්කය, අංක 43 දරණ සෙංකඩගල මැතිවරණ දිස්ත්‍රික්කය, අංක 44 දරණ කුණ්ඩසාලේ මැතිවරණ දිස්ත්‍රික්කය, අංක 45 දරණ තෙල්දෙණිය මැතිවරණ දිස්ත්‍රික්කය, අංක 46 දරණ මිනිපේ මැතිවරණ දිස්ත්‍රික්කය, අංක 49 දරණ හේවාහැට මැතිවරණ දිස්ත්‍රික්කය, අංක 50 දරණ ගම්පොල මැතිවරණ දිස්ත්‍රික්කය, අංක 51 දරණ නාවලපිටිය මැතිවරණ දිස්ත්‍රික්කය, අංක 54 දරණ මස්කෙළිය මැතිවරණ දිස්ත්‍රික්කය.

වර්ෂ 1962ක්වූ මාර්තු මස 31 වෙනි දින,
මහනුවර කච්චේරියේ පිහිටි මැතිවරණ කාර්යාලයේදීය.

4-426/2

---

## 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව

### 1961 ඡන්දදායක නාමලේඛන සංශෝධනය කිරීම

මැතිවරණ කොට්ඨාශ අංක 55—බලපිටිය
මැතිවරණ කොට්ඨාශ අංක 56—අම්බලන්ගොඩ
මැතිවරණ කොට්ඨාශ අංක 57—බෙන්තර-ඇල්පිටිය
මැතිවරණ කොට්ඨාශ අංක 58—හිනිදුම
මැතිවරණ කොට්ඨාශ අංක 59—බද්දේගම
මැතිවරණ කොට්ඨාශ අංක 60—රත්ගම
මැතිවරණ කොට්ඨාශ අංක 61—අක්මීමන
මැතිවරණ කොට්ඨාශ අංක 62—ගාල්ල
මැතිවරණ කොට්ඨාශ අංක 63—හබරාදූව

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාශවල ඡන්දදායක නාමලේඛන සහතික කරන ලද බවත් , එකී නාමලේඛන කාර්යාල වේලාවන්හිදී පරීක්ෂාකර බලා ගැනීම පිණිස, ගාල්ලේ කච්චේරියේ තබා ඇති බවත් 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවේ 22 (1) වැනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙනු ලැබේ.

ඒ. ඇස්. නවරත්නරාජා,
ලියාපදිංචි කිරීමේ නිලධාරි තැන,
මැතිවරණ කොට්ඨාශ අංක 55—බලපිටිය, මැතිවරණ කොට්ඨාශ අංක 56—අම්බලන්ගොඩ, මැතිවරණ කොට්ඨාශ අංක 57—බෙන්තර-ඇල්පිටිය, මැතිවරණ කොට්ඨාශ අංක 58 හිනිදුම, මැතිවරණ කොට්ඨාශ අංක 59—බද්දේගම, මැතිවරණ කොට්ඨාශ අංක 60—රත්ගම, මැතිවරණ කොට්ඨාශ අංක 61—අක්මීමන, මැතිවරණ කොට්ඨාශ අංක 62—ගාල්ල, මැතිවරණ කොට්ඨාශ අංක 63—හබරාදූව.

1962 අප්‍රේල් මස 3 වැනි දින,
ගාල්ලේ මැතිවරණ කාර්යාලයේදීය.

4-426/3

## 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව

### 1961 ඡන්දදායක නාමලේඛන සංශොධනය කිරීම

අංක 64—වැලිගම මැතිවරණ කොට්ඨාශය
අංක 65—අකුරැස්ස මැතිවරණ කොට්ඨාශය
අංක 66—දෙනියාය මැතිවරණ කොට්ඨාශය
අංක 67—හක්මන මැතිවරණ කොට්ඨාශය
අංක 68—කඹුරුපිටිය මැතිවරණ කොට්ඨාශය
අංක 69—මාතර මැතිවරණ කොට්ඨාශය
අංක 70—දෙවිනුවර මැතිවරණ කොට්ඨාශය

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාශවල ඡන්දදායක නාමලේඛන සහතික කරන ලද බවත්, එකී නාමලේඛන කායර්‍යාල වේලාවන්හිදී පරීක්‍ෂාකර බලා ගැනීම පිණිස මාතර කච්චේරියේ තබා ඇති බවත් 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවේ 22 (1) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එල්. ඒ. ජී. ජයසේකර,
අංක 64—වැලිගම, අංක 65—අකුරැස්ස, අංක 66—දෙනියාය, අංක 67—හක්මන, අංක 68—කඹුරුපිටිය, අංක 69—මාතර සහ අංක 70—දෙවිනුවර මැතිවරණ කොට්ඨාශවල ලියාපදිංචි කිරීමේ නිලධාරි තැන.

දිසාපති කායර්‍යාලය,
මාතර,
1962 අප්‍රේල් මස 2 වැනි දා.

4-426/4

---

## 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව

### ඡන්දදායක නාමලේඛන සංශෝධනය කිරීම—1961

අංක 86 දරණ වවුනියා මැතිවරණ දිස්ත්‍රික්කය

ඉහත සඳහන් මැතිවරණ දිස්ත්‍රික්කයේ ඡන්දදායක නාමලේඛනය සහතික කර ඇති බවත් එය වවුනියා කච්චේරියේ මැතිවරණ අංශයේදී එහි වැඩ කරන කාලය තුළ පරීක්‍ෂා කර බැලිය හැකි බවත් 1946 ලංකා (පාර්ලිමේන්තු මහා මැතිවරණ පිළිබඳ) රාජ්‍ය සභා නියෝගයේ 22 (1) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඈන්. බී. ඇම්. සෙනෙවිරත්න,
අංක 86 දරණ වවුනියා මැතිවරණ දිස්ත්‍රික්කයේ ලියාපදිංචි කිරීමේ නිලධාරී තැන.

1962 මාර්තු මස 30 වැනි දින,
වවුනියා කච්චේරියේදී.

4-426/5

---

## 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව

### 1961 ඡන්දදායක නාමලේඛන සංශෝධනය කිරීම

මැතිවරණ කොට්ඨාශ අංක 91—අම්පාරේ
මැතිවරණ කොට්ඨාශ අංක 93—කල්මුනේ
මැතිවරණ කොට්ඨාශ අංක 94—නින්තාවූර්
මැතිවරණ කොට්ඨාශ අංක 95—පොතුවිල්

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාශවල ඡන්දදායක නාමලේඛන සහතික කරන ලද බවත්, එකී නාමලේඛන කායර්‍යාල වේලාවන්හිදී පරීක්‍ෂා කර බලා ගැනීම පිණිස උහන, අම්පාරේ කච්චේරියේ තබා ඇති බවත් 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවේ 22 (1) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩී. අලුවිහාරේ,
අංක 91—අම්පාරේ, අංක 93—කල්මුනේ, අංක 94—නින්තාවූර්, අංක 95—පොතුවිල් යන මැති මැතිවරණ කොට්ඨාශවල ලියාපදිංචි කිරීමේ නිලධාරිතැන.

1962 මාර්තු 31 වැනි දින,
උහන, අම්පාරේ කච්චේරියේ දීය.

4-426/6

---

## 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව

### 1961 ඡන්දදායක නාමලේඛන සංශෝධනය කිරීම

මැතිවරණ කොට්ඨාශ අංක 121—බිබිල
මැතිවරණ කොට්ඨාශ අංක 129—මොණරාගල

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාශවල ඡන්දදායක නාමලේඛන සහතික කරන ලද බවත්, එකී නාමලේඛන කායර්‍යාල වේලාවන්හි දී පරීක්‍ෂා කර බලා ගැනීම පිණිස මොණරාගල කච්චේරියේ තබා ඇති බවත් 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවේ 22 (1) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ස. දේ. සපරමාදු,
ලියාපදිංචි කිරීමේ නිලධාරි තැන,
මැතිවරණ කොට්ඨාශ අංක 121—බිබිල සහ
මැතිවරණ කොට්ඨාශ අංක 129—මොණරාගල.

1962 මාර්තු මස 26 වැනි දින,
මොණරාගල කච්චේරියේදීය.

4-426/7

---

## 4 බී පෝර්මය

### 1949 නො. 3 දරණ ඉන්දියානු සහ පකිස්තානි නිවැසි (පුරවැසි) පනත

පනතේ දහවැනි වගන්තිය යටතේ දැන්වීමයි.

ඉන්දියානු සහ පාකිස්තානි වාසින් ලියාපදිංචිකිරීමේ කොමසාරිස් තැන්පත් විජයපාල වියුඩර් ජයසිංහ වන මා, 1949 නො. 3 දරණ ඉන්දියානු සහ පකිස්තානි නිවැසි (පුරවැසි) පනතේ දහවැනි වගන්තිය යටතේ දැනුම් දී සිටින්නේ පහත සඳහන් උප ලේඛනයේ දක්වන සෑම ඉල්ලුම් පත්‍රයක්ම එකී පනතේ 4 වැනි වගන්තියේ 1 වැනි සහ 2 වැනි උප වගන්ති යටතේ අනුමතකිරීමට යම්කිසි මහජනයෙකුගේ විරුද්ධතාවයක් ඇත්නම් කුමන කාරනා නිසා එවැනි විරුඩතාවය මුල්කරගනු ලැබීද යනු සඳහන් ලිපියක් මෙම දැන්වීම ප්‍රසිද්ධකළ දින සිට මසක් තුළදී නොලැබුනි නම් ඒ සෑම ඉල්ලුම්පත්‍රයක්ම අනුමතකරන බවයි.

විරුද්ධවන සෑම අයෙකුගේම සම්පූර්ණ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල සෑම විරුද්ධවීමේ නිවේදනයකම ඇතුලත්විය යුතුයි.

වී. ටී. ජයසිංහ,
ඉන්දියානු සහ පාකිස්තානි වාසින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් තැන.

කොළඹ,
1962 ක්වූ අප්‍රෙල් මස 7 ද.

### උප ලේඛනය

| ඉල්ලුම් පත්‍රයෙහි නො. සහ දිනය | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචි කිරීමට අයැද සිටින ඉල්ලුම්කරුගේ නම සහ ලියුම් ලැබෙන පිළිවෙළ | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචි කිරීමට ඉල්ලුම් කරන අයගේ නමත් සමග ලියාපදිංචි කිරීමට අයැද සිටින අන්‍ය අයකුගේ නම සහ ඉල්ලුම්කරුට ඇති සම්බන්ධය | |
|---|---|---|---|
| වී. 17 ... | නවෙත්‍ර කරුප්පයියා සෙල්ලයියා පිල්ලෙයි, ... | ... සෝමා සුබ්‍රමනියම් | (භායර්‍යාව) |
| 1.11.50 ... | අංක 33, බසාර් වීදිය, බදුල්ල ... | ... තංගවේලු | ( පුතා ) |
| | | වේලායුදම් | ( පුතා ) |
| | | ෂන්මුගම් | ( පුතා ) |
| ඊ. 322/සී ... | අබ්බාස්බෝයි මොහමඩ් අලි, ... | ... කුබරාබායි | (භායර්‍යාව) |
| 4.6.51 ... | අංක 81, පරන යොන් වීදිය, කොළඹ 12 ... | ... සිරින්බායි | ( දුව ) |
| | | හුසෙයින් | ( පුතා ) |
| | | අන්වර් අලි | ( පුතා ) |

4—389

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

මගේ අංකය : නීති/ණ/22.

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයන් යටතේ අංක 401 දරණ ජාතික නිවාස පනතේ 76 වැනි ඡේදය අනුව උකස් කරනු ලැබූ ඉඩම් විකිණීම සඳහා බලය දීම

ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයන් යටතේ අංක 401 දරණ ජාතික නිවාස ආඥාපනතේ අංක 9 (1) (බී) දරණ වගන්තිය යටතේ පත් කරනු ලැබූ ජාතික නිවාස සහකාර කොමසාරිස් තැන්පත් ධනපාල සිරිසේන වීරසිංහ වන මම ලංකාණ්ඩුව සඳහා සහ වෙනුවෙන් ක්‍රියා කරමින් පානදුරේ ඇල්. ඇස්. ප්‍රනාන්දු, ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් සහතික කරන ලද 1956 පෙබරවාරි 1 වැනි දින අංක 1462 දරණ උකස්කරය යටතේ සහ මුදල් ගෙවීම පැහැර හැර ඇති බැවින් බණ්ඩාරගම, වීදාගම වලව්වේ, ඊස්ටස් ඒබ්‍රහම් බණ්ඩාර සහ ජොහානා ප්‍රොලෙන්තිනා විජේසුන්දර යන දෙදෙනා ගෙන් 1961 ජූලි 31 වැනි දින තෙක් අයවිය යුතු රුපියල් විසිනමදහස් පහළොවයි ශත අනූ තුන (රු. 29,015.93) අයකර ගැනීම සඳහාත්, එසේම 1961 ජූලි 31 වැනි දින සිට විකිණීම පැවැත්වෙන දිනය හෝ සම්පූර්ණයෙන් ගෙවන දිනය දක්වා තවදුරටත් වූ රුපියල් දහනව දහස් අටසිය විසි එකයි ශත තිස් හය (රු. 19,821.36) ක මුදලක් සම්බන්ධයෙන් වන පොළී මුදල වර්ෂයකට සියයට හතරේ ප්‍රමාණයට යථෝක්ත උකස්කර ප්‍රකාර 1961 ජූලි 31 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් එකතුවන සියළුම දඩ මුදල් සමග අයකර ගැනීමත් එසේ අයකර ගැනීමෙදි දැරීමට සිදුවන වියදම් සහ ගාස්තු අයකර ගැනීම සඳහාත්, මෙහි පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ඉඩම සහ එයට අදාල සියළු දේත් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම පිණිස ආඥා නිකුත් කර එසේ විකිණීමු සඳහා කොළඹ 12, අළුත්කඩේ අංක 239 දරණ ස්ථානයේ ඩී. ඒ. සමරසිංහ, ප්‍රසිද්ධ වෙන්දේසිකරුට බලය දෙමි.

ධන්පාල වීරසිංහ,
ජාතික නිවාස සහකාර කොමසාරිස් තැන.

1962 මාර්තු මස 30 වෙනි දින,
කොළඹ 2.

### උපලේඛනය

සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට, කෝරළයේ උඩ පත්තුවේ වෙරළුපේ පිහිටි, උතුරින් පල්ලෙහවත්තද, නැගෙනහිරින් දෙපාවැල්ලද, දකුණින් හසන් මරික්කාර්ට අයිති ඉඩමද, බස්නාහිරින් පිටකන්දේගේනද, මායිම්ව පිහිටා ඇති කුරක්කන් කුරුනි දහයක වපසරිය ඇති (සමහර විට කුරුණි හයක් හැටියට විස්තර කර ඇති) දෙබාන ගොඩගෙවත්ත නමැති ඉඩම සහ මාණකයේ විස්තර කර ඇති පරිදි රත්නපුර ඉඩම් ලියාපදිංචිකිරීමේ කාර්යාලයේ අංක ඒ. 344/197 දරණ අංකය යටතේ ලියාපදිංචිකර ඇති වෙරළුපේ කෙළින් පාරේ වරිපනම් අංක 47, 49, සහ 52/1 දරණ 1949 ජූලි 17 වැනි දින ඩික්සන් ආවිගල මිනින්දෝරු තැන විසින් සකස් කරන ලද අංක 1,003 දරණ මාණක සැලැස්ම පරිදි උතුරින් පරණවත්ත නොහොත් අළුත්වැල්ල දෙබානගොඩගෙවත්ත නොහොත්, කිරිහේනගෙවත්ත පල්ලෙහවත්තද, නැගෙණහිරින් ප්‍රධාන පාර සහ කලවිටිකුඹුරයායද, දකුණින් එස්. අත්සනා, ජී. පුල්ලෙනායගම් සහ කේ. ආර්. පෙරේරා යන අයට අයිති ඉඩම්ද, බස්නාහිරින් කැකිල්ලගේන සහ බන්ඩාර ඉඩම සහ පතාවන නොහොත්, අළුත්වැල්ලද, මායිම්ව පිහිටා ඇති ප්‍රමාණයෙන් අක්කර දෙකයි රූඩ් එකයි පර්චස් දෙකක් (අ. 2, රූ. 1, ප. 2) වූ ඉහතකී පරිදි එහි ඇති ගොඩනැගිලි සහිත දෙබානගොඩගෙවත්ත සහ කිරිහේනගෙවත්ත ද වේ.

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරළයේ අධිකාරි, පත්තුවේ වීදාගම පිහිටි, ජී. 86/13 දරණ අංකය යටතේ ලියාපදිංචිකර ඇති ප්‍රමාණයෙන් අක්කර පහක් පමණ වූ මහවත්ත නමැති ඉඩමට උතුරින් රත්නපුර සිට සහ රත්නපුර දක්වා ඇති මහා මාර්ගයද, ඊශාන්‍යන් ප්‍රමාණයෙන් වහීයාර 10ක් වූ මෙම නමින්ම යුත් ඉඩම් ද, නැගෙනහිරින් කළුබෝවිලගෙවත්ත සහ ගම්මැද්දෙවත්තද, දකුණින් කරණායකගෙවත්තද, බස්නාහිරින් දැනට කරත්ත පාරක්ව පවතින රණවකගෙවත්තද, මායිම්ව පිහිටා ඇත. නමුත් ඉඩම මැනීමෙන් පසු 1948 සැප්තැම්බර් 17 වැනි දින ඩී. ජේ. මාගොඩරත්න, මිනින්දෝරු තැන විසින් සකස් කරන ලද අංක 94 දරණ මාණක සැලැස්ම පරිදි ප්‍රමාණයෙන් අක්කර තුනයි රූඩ් තුනක් (අ. 3, රූ. 3, ප. 0) වූ මෙම ඉඩමට උතුරින් පානදුර සිට රත්නපුර දක්වා ඇති මහා මාර්ගද, නැගෙනහිරින් කළුබෝවිලගෙවත්ත සහ ගම්මැද්දෙවත්තද, දකුණින් කරණායකගෙවත්තද, බස්නාහිරින් කරත්ත පාරකින්ද මායිම් යෙදී ඇත.

4-119

## වෙළඳ සමාගම් ආඥාපනත

### ඉච්ඡානුග ඇවරකිරීමට පාත්‍රව තිබෙන—" සීමාසහිත ස්වේෂනර්ස් " සමාගමේ නම, 277 (4) වැනි වගන්තිය යටතේ කපා හැරීමේ දැන්වීම

1861 බද්ධ ව්‍යාපාර වස්තු වෙළඳ සමාගමේ ආඥාපනතේ විධි විධාන යටතේ 1927 ක්වූ සැප්තැම්බර් මස 21 වැනි දින සංස්ථාපිත වෙළෙඳ සමාගමක් වන, (ඇවර කිරීමට පාත්‍ර ව තිබෙන) සීමාසහිත සිලෝන් ස්වේෂනර්ස්හි ඇවර කරුවකු ක්‍රියා නොකරන බැව් විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නො කිරීමට හේතු නො දැක්වුවහොත් අද දින සිට තෙ මසක් ඉකුත් වූ විට, (ඇවර කිරීමට පාත්‍ර ව තිබෙන) සීමාසහිත සිලෝන් ස්වේෂනර්ස් නමැති වෙළෙඳ සමාගම රෙජිස්තරයෙන් කපා හරින බවත්, වෙළඳ සමාගම විසුරුවා හරින බවත්, වෙළඳ සමාගම රෙජිස්ට්රාර් වෝල්ටර් මහේෂ සෙල්ලයියා වන මම වෙළෙඳ සමාගම් ආඥාපනතේ 277 (4) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩබ්ලිව්. ඇම්. සෙල්ලයියා,
වෙළෙඳ සමාගම් රෙජිස්ට්රාර්.

1962 අප්‍රේල් මස 3 වැනි දින,
කොළඹ, එච්ලන් චතුරශ්‍රයේ, පස්වැනි ගොඩනැගිල්ලේ,
වෙළෙඳ සමාගම් රෙජිස්ට්රාර් දෙපාර්තමේන්තුවේදී ය.

4-264

## වර්ෂ 1940 අංක 9 දරණ ආඥා පනතේ 43 වෙනි වගන්තිය යටතේ බලය පැවරීම

වර්ෂ 1940 අංක 9 දරණ ආඥා පනතේ 43 (අ) වගන්තිය යටතේ පුරාවිද්‍යා කොමසාරිස්වරයා වෙත පැවරී ඇති බලතල අනුව ඔහුට කළ හැකි සෑම රාජකාරියක්ම තමාගේ දිසාව තුළ පමණක් කිරීමට පොළොන්නරුවේ ආණ්ඩුවේ ඒජන්ත තැනවූ වාද්දුවගේ රිජ්වේ පෙරේරා තිලකරත්න මහතා පත් කොට තිබේ.

චාල්ස් ගොඩකුඹුරේ,
වැඩබලන පුරාවිද්‍යාකොමසාරිස්.

4-452

## දැන්වීමයි

නැගෙනහිර පලාතේ උහන දිස්ත්‍රික්කයේ උහන කරවන ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ ගල්ඔය වම් ඉවුරේ අංක 8, 17, 10, 18, 9 සහ 26 කොට්ඨාශවල ගවයින් අතර, " හෙමරජික් සෙප්ටිසීමියා " නමැති රෝගය පැතිරී යන බැව් 1957 තේ අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥාපනතේ 327 පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ (1) අතුරු වගන්තිය යටතේ මා විසින් වර්ෂ 1962 ජනවාරි 12 දින අංක 12,875 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද, දැන්වීම අද දින සිට අවලංගු වන බව මහජනයාට මෙයින් දැනුම් දෙමි.

ආරියදාස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරී.

1962 අප්‍රේල් 4 වැනි දින,
පේරාදෙනියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය කාර්යාලයේදී ය.

4-268

## රජයේ නිවේදනයයි

### කැලණියේ ස්වෙෂන් පාරේ දුම්රිය හරස්පාරේ රථවාහන ගමනා ගමන පාලනය කිරීම

1962 මාර්තු මස 25 වැනි දින සිට ඉහත සඳහන් දුම්රිය හරස් පාරේ පිහිටි ලී ගේට්ටුව ඉවත්කර, ඒ වෙනුවට විදුලි මෝටරයකින් ක්‍රියාකරවන හරස්පොලු ගේට්ටුවක් (උඩට පහතට ක්‍රියා කරවන) සවි කරනු ලැබේ. දුම්රිය හරස් පාර හරහා ඇති මහා මාර්ගය, රථ වාහන හැසිරවීම සඳහා කොටස් දෙකකට බෙදනු ලැබ, මහා මාර්ගයේ යොදා ඇති වර්ණාලෝක සංඥා ක්‍රමය අනුව, මෙම ගේට්ටුව ඉදිරියෙන් ද, වර්ණාලෝක සංඥා සවිකර ඇත. පහත දැක්වෙන පිළිවෙලට අනුකූලව ක්‍රියාත්මක වන ආලෝක සංඥා සියලුම රියදුරන් විසින් පිළිපැදිය යුතු වෙයි :—

1. සෑම බැරියරයකටම අඩි 27 ක් ඉදිරියෙන්, මහා මාර්ගය හරහා " නැවතීමේ රේඛාව " නමින් හැඳින්වෙන ධවල රේඛාවක් (WHITE LINE) සෑම ආලෝක සංඥාවක් හා සම්බන්ධිතව සලකුනු වෙයි.
2. නැවතීමේ රේඛාවේ සිට අඩි 20 ක් පිටුපසින් රතු, කහ සහ කොල යන ත්‍රී වර්ණයෙන් යුත් ලාම්පු තුනකින් සමන්විත වර්ණාලෝක සංඥාවක් රථවාහන පේලිය පාලනය කිරීමට ඊට අභිමුඛව ඉදිකර ඇත.

3. රතු පැහැති ලාම්පුව ඉහලින් ද, කොල පැහැති ලාම්පුව පහලින් ද දැක්වෙන පරිදි ලම්භාකාරව මේම සංඥා පුවරුව පිලියෙල කර ඇත.

4. රථ වාහන පාලනය සඳහා පහත දැක්වෙන අනුක්‍රමයෙන් ආලෝක සංඥා දිස්වනු ඇත :—

(අ) ලාම්පු ලෙන්සයේ "STOP" යන්න සඳහන් රතු වර්ණය

(ආ) කහ සහ රතු එක විටම.

(ඇ) ලාම්පු ලෙන්සයේ "GO" යන්න **සඳහන්** කොල වර්ණය.

(ඈ) කහ වර්ණය පමණක්.

5. ඉහත සඳහන් සංඥා වලින් අදහස් වන දෑ පහත පල වේ :—

(අ) කොල සංඥාව දිස්වන තුරු නැවතීමේ රේඛාවෙන් ඉදිරියට නොයා යුතු බව රතු සංඥාවෙන් අදහස් කරයි.

(ආ) රතු පැහැයෙන් කොල පැහැයට, ලඟම ඇති වෙනස් වීමක් රතු සමග දිස්වන කහ සංඥාවෙන් ප්‍රකාශ වෙයි. එහෙත් රතු සංඥාවෙන් දක්වෙන තහනම වෙනස් නොවෙයි.

(ඇ) ප්‍රවේසම් සහිතව ඉදිරියට ගමන් කල යුතු බවත්, එමෙන්ම රථ වාහන පාලනය කරන පොලිස් නිළධාරියෙකු විසින් හෝ බලය ලත් අන් කිසිවකු විසින් හෝ නිකුත් කරන හැසිරවීම් වලට යටත්ව සංඥාව පසුකල යුතු බවත්, කොල පාට සංඥාවෙන් ප්‍රකාශ වෙයි.

(ඈ) සංඥාව, රතු පැහැයට ලඟම වෙනස් වීමක් සිදුවන බව තනිව ඇති කහ සංඥාව දක්වයි. එය නැවතීමේ රේඛාවෙන් ඉදිරියට කිසිම වාහනයක් නොයා යුතු බවට ලකුනක් බව සැලකිය යුතුයි.

6. මෙම වර්ණාලෝක සංඥා, යම් අවස්ථාවක ක්‍රියා විරහිත වුවහොත්, මෙම දුම්රිය පාර හරහා ඇති ගේට්ටුව සමීපයෙහි සිට කරනු ලබන අත් සංඥාවලට සියලුම රියදුරන් අවනත විය යුතුය.

4-243

---

## නිවැරදි කිරීමයි

**වර්‍ෂ 1936යේ අංක 16 දරණ සමුපකාර සමිති පිළිබඳ ආඥාපනත**

### සමුපකාර සමිති වසාදැමීමේ කටයුතු අවසන් කිරීම

1962 මාර්තු 30 වැනි දින අංක 13,000 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ 517 වැනි පිටුවේ පලවී ඇති දැන්වීමේ දැක්වෙන වසා දමන ලද සමිතිවල 1 වෙනි සමිතියේ නම "**සිමාසහිත හුලංදෙව වත්ත සමුපකාර කඩ සමිතිය**" කියා නිවැරදිවිය යුතුයි.

4-802

## විශෙෂ නිවේදනයයි

1962 අප්‍රේල් 14 වෙනි සෙනසුරාදා සහ 20 වෙනි සිකුරාදා ආණ්ඩුවේ නිවාඩු දිනයන් වන බැවින්, 1962 අප්‍රේල් 19 වැනි දින නිකුත් කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1962 අප්‍රේල් 13 වැනි සිකුරාදා පස්වරු 3.30ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්නට සැලැස්විය යුතු බව කාගේත් දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1962 අප්‍රේල් 6 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි